# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2241/5 - 2021 අගෝස්තු මස 16 වැනි සඳුදා - 2021.08.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නිවේදනය

2011 අංක 02 දරන ඌව පළාතේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තියේ
2 (3) (ආ) වගන්තිය ප්‍රකාරව සිදු කරනු ලබන දැනුම් දීමයි

2011 අංක 02 දරන ඌව පළාතේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තියේ 2 (2) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී ප්‍රඥප්තියේ 2 (1) වන උප වගන්තියේ (ආ) සහ (ඇ) වගන්තිවල සඳහන් කරුණු කිසිවක් කන්දකැටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් සිදු කර ඇත්තේ ද යන්න පිළිබඳව පරීක්ෂා කොට මා වෙත වාර්තා කිරීම සඳහා අධිකරණ විනිසුරු එච්. එම්. ආර්. අනුර කුමාර මහතා පත් කරන ලද අතර එම පරීක්ෂණ වාර්තාවේ සඳහන් කරුණු සැළකිල්ලට ගෙන 2011 අංක 02 දරන ඌව පළාතේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තියේ 2 (3) (අ) ඡේදය යටතේ කන්දකැටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සම්බන්ධව මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 2217/45 හා 2021.03.05 දිනැති *අති විශේෂ ගැසට්* පත්‍රයේ සිදු කරනු ලැබූ නියෝගය එම ප්‍රඥප්තියේ 2 (3) (ආ) වගන්ති ප්‍රකාරව 2021.08.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් අවලංගු කරනු ලැබේ.

**ඒ. ජේ. එම්. මුසම්මිල්,**
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2021 ක් වූ අගෝස්තු මස 16 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

08-443

1A - PG 5530 — 25 (2021/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*